ආරම්භ කළ දිනය



දින 15 පසු



දින 30 කට පසු



76806 00L



වස විසවලින් තොර නීරෝගී, නිවහල්, තෘප්තිමත්
අනාගතයක උරුමය වෙනුවෙන් කැප වෙමු.

info@dilmahconservation.org
www.dilmahconservation.org

Tel: 0114822490

ඩිල්මා සංරක්ෂණ
තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය
සහ
මෙරිල් ජේ. ප්‍රනාන්දු පුණ්‍ය පදනම
340, ගාලු පාර,
කටුබැද්ද, මොරටුව.

ප්‍රකාශනය - 10.01.2013

එළවළු තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ විෂ රහිත තීන්ත භාවිතයෙන්
ශ්‍රී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්) සමාගම මගින් මුද්‍රණය කරන ලදී.

PRINTED WITH VEGETABLE-BASED INKS • LOW VOC'S •

FSC MIX Paper FSC™ C111936



## නිරෝගී දිවියකට වස-විසෙන් තොර ආහාර ඔබේ ගෙවත්තෙන්

# කුස්සියේ කොම්පෝස්ට් ගෙවත්ත

ඩිල්මා සංරක්ෂණ
තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය

(1) කුඩා ගෙවත්තක් සාදා ගැනීමට ඇතැයි සිතන බාධක

- ඉඩකඩ
- පොහොර
- ජලය
- කාලය
- ශ්‍රමය
- දැනුම හා අවබෝධය.

ඒවා විසඳීමට ඇති එක් ක්‍රමයකි කුස්සියේ කොම්පෝස්ට් ගෙවත්ත

(2) කුස්සියේ කොම්පෝස්ට් ගෙවත්ත සාදන්නේ කොහොමද?

- ගෙවත්තේ බෝග වගා කළහැකි කුඩා ඉඩකඩක වගාපාත්තිය මත කුඩා කොම්පෝස්ට් කොටු සාදා ගන්න.

(3) අවශ්‍ය ද්‍රව්‍ය මොනවාද?

- අඟලක් පළල අඟල් 15 ක් 16ක් පමණ දිගට උණ ලී පටි සාදාගන්න.
- සිහින් කොහු ලණුවක්
- හොඳින් දිරූ කොම්පෝස්ට් හෝ ගොම පොහොර තාච්චි 01ක්
- වියලි හා අමු පැලෑටි, පත්‍ර, තණකොළ
- කුස්සියේ ඉවතලන අපද්‍රව්‍ය හා රොඩු කුණු
- පොල් ගෙඩි 4 ක පමණ ලෙලි
- තේ කොළ මන්ඩි
- බිත්තර කටු ආදිය
- එළවළු මාළු සෝදන වතුර

4) සාදන්නේ කොහොමද?

- පාත්තියක් සාදා ගන්න.
- පාත්තියේ කෙලවරට අඩි 1 1/2 ක් තබන්න.
- පාත්තිය තුළ කොටු 02 ක් අතර අඩි 3 ක පරතරයක් තබන්න.




- සාදාගත් පාත්තිය මත උණපතුරු පුවක් ලී වැනි දෙයක් සිටවා අඩි 01 ක් විෂ්කම්භය ඇති රවුම් කොටුවක් සාදාගන්න.




- එම කොටුවේ උඩින් සිහින් ලණුවකින් කෝටු එක්වන සේ රවුමට බැඳගන්න.
- කොටුවේ ඇතුළෙන් අඟල් 2ක් පමණ පස් ඉවත් කරන්න.
- එම කොටුව අමුකොළ, වියළිකොළ, කුස්සියේ ඉවතලන ද්‍රව්‍ය, වෙනත් රොඩු, කුණු දමා තද කරන්න.
- ඒ මත දිරූ කොම්පෝස්ට් හෝ දිරූ ගොම දමා ඒ මත කපාගත් කෙසෙල් පරඩැල්, පිදුරු, වියළිකොළ දමන්න.
- කොටුව වටා පිටට අඩියක් රවුමට පොල්ලෙලි අල්ලන්න. (පොල්ලෙල්ල හරස් අතට ඇතුල්පැත්තට කොහු සිටින ලෙස)
- එම රවුම පොල්ලෙලි මට්ටමට වතු පස් 01 කොම්පෝස්ට් හෝ දිරූගොම 01 මිශ්‍ර කර පුරවන්න.
- ඉන්පසු ඒ තුළ පැල සිටවන්න.



- පැල මුල් අල්ලන තුරු හෝ බීජ පැලවී සතියක් දෙකක් යනතුරු පාත්තිය හා පෝර කොටුව තෙමන්න.

- ඉන්පසු කුස්සියේ අප ද්‍රව්‍ය සෝදන වතුර ආදිය දිනපතා කොටුව තුළට පමණක් දමන්න. අමතර වතුර දැමීමක් පොහොර දැමීමක් අවශ්‍ය නැත.
- බෝගය සාර්ථකව වැඩෙයි.
- කුස්සිය පිරිසිදු වෙයි.
- මිදුල අතුගාන දිරාපත්වන කොළ රොඩුද දැමිය හැකි වෙයි.
- මිදුලද පිරිසිදු වෙයි.
- සෞඛ්‍යය ආරක්ෂා වෙයි.
- වල් පැලෑටි පාලනය පහසුවෙයි.

මෙම ක්‍රම භාවිතයෙන් කුඩා ගෙවත්තක් සාදා ගැනීමට ඇතැයි අප සිතූ බාධක විසඳෙයි.